# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2264/4 - 2022 ජනවාරි මස 24 වැනි සඳුදා - 2022.01.24**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## III වැනි කොටස - ඉඩම්

### ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය*: තිප්‍රාලේ/1/8/3/74(ඉඅත් මැනුම්/2021/07).
*ඉඩම් අමාත්‍යාංශ ගොනු අංකය*: 4-3/6/2019/HW/247.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර* :-

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දෙමටගොඩ ග්‍රාම නිලධාරි කොට්ඨාසයෙහි, දෙමටගොඩ (කොළඹ මහ නගර සීමාව තුළ) ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් වෙනුවට කොළඹ දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් පිළියෙල කරන ලද අංක කො 9974 දරන හා 2022.01.07 දිනැති මූලික පිඹුරෙහි ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.1413 ක් වූ කැබලි අංක 01 සිට 03 දක්වා වූ කැබලි :

01. **කැබලි අංක 01**
ඉඩමේ නම: වරිපනම් අංකය 752/5, ඩැනිස්ටර් ද සිල්වා මාවත; ඉඩමේ විස්තරය: ගෙවත්ත, සිමෙන්ති ගල් ඇතුරු බිම; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: අංක 752/5, ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 09 ලිපිනයේ පදිංචි ශාන්ත අන්තෝනි පුද්ගලික සමාගම. (අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා.); ප්‍රමාණය: හෙක්. 0.0042.

02. **කැබලි අංක 02**
ඉඩමේ නම: වරිපනම් අංකය 752, ඩැනිස්ටර් ද සිල්වා මාවත; ඉඩමේ විස්තරය: ගෙවත්ත, සිමෙන්ති ගල් ඇතුරු බිම; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: අංක 752, ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 9 ලිපිනයේ පදිංචි ඔරයින් සිටි පුද්ගලික සමාගම. (අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා.); ප්‍රමාණය: හෙක්. 0.0022.

03. **කැබලි අංක 03**
ඉඩමේ නම: දෙමටගොඩ ඇළ ; ඉඩමේ විස්තරය: ඇළ; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: - (මූ.පි. කො 8183 හි 11 වැනි කැබැල්ලේ සහ අංක නොකරන ලද ඇළෙහි කොටස්. නව කැළණි පාලමේ සිට රාජගිරිය දක්වා කණු මතින් ඉදිවන මාර්ග ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය වී ඇත.); ප්‍රමාණය: හෙක්. 0.1349.

1A - G 35887 – 17 (2022/01)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2022 පෙබරවාරි මස 21 වැනි දින පෙ. ව. 9.30 ට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2022 පෙබරවාරි මස 14 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඇති ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

ප්‍රාදේශීය ලේකම්,
තිඹිරිගස්යාය.

තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 01 - 0237

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.